**පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල - 2016**

-------------------------------------------------------

පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, පළාත් පාලන සේවා ආඥා පනතේ (264 අධිකාරිය) 62 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට **(ISSAI 1000 – 1810)** අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 අහිතකර මතය සඳහා පදනම

-------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 අහිතකර මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

2013 ඔක්තෝබර් 02 දිනැති අංක 03/2013 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත පිළියෙල කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ පොදු ගිණුම හරහා ගනුදෙනු සිදුකර තිබීම හේතුවෙන් විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබූ රු.1,090,670,647 ක් වූ විශ්‍රාම වැටුප් වියදම මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි.

#### 2.2.3 අධිකාර බලයෙන් තහවුරු නොවූ ගනුදෙනු

ලැබිය යුතු දායක මුදල් වලට අදාලව 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව හා එදිනට බිල්පොත් ලේඛනය අතර පැවති රු. 63,071,535 ක් වූ වෙනස අදාල පළාත් පාලන ආයතනවලින් ශේෂ තහවුරු ලබා ගැනීමකින් තොරව හා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ, අමාත්‍යාංශ ලේකම්වරයාගේ හා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී සමුච්චිත අරමුදලට එරෙහිව කපාහැර තිබුණි.

#### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

නියැදි පරීක්ෂාවට අනුව පළාත් පාලන ආයතන 06 ක් ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක ශේෂය සහ සමාලෝචිත වර්ෂයේ අරමුදල් ගිණුම සමඟ ඉදිරිපත්කර තිබුණු ශේෂ ලැයිස්තුව අතර රු. 637,799 ක වෙනසක් පැවතිණි.

#### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

විශ්‍රාම වැටුප් දත්ත පද්ධතියට අනුව, 2016 ජනවාරි මාසය සහ 2016 දෙසැම්බර් මාසය අතර අරමුදලේ විශ්‍රාමිකයින් සංඛ්‍යාවේ 310 ක අඩුවීමක් නිරීක්ෂණය විය. ගිණුම සමඟ ඉදිරිපත් කළ ශේෂ ලැයිස්තුව අනුව රු. 3,091,382 ක වටිනාකමක් වර්ෂයේ මියයෑම් වශයෙන් සලකා තිබුණද එම මුදල කොපමණ මරණ සංඛ්‍යාවකට ද යන්න ගිණුම් අනුව අනාවරණය කරගත නොහැකි විය.

**2.2.6 ලැබිය යුතු ගිණුම්**

ඉදිරිපත්කර තිබුණු විශ්‍රාම වැටුප් දායක මුදල් ලැයිස්තු අනුව, පළාත් පාලන ආයතන 109 කින් අයවිය යුතු එකතුව රු. 525,969,061 ක් වූ මුදලින් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයවී නොතිබූ අතර මේ සම්බන්ධයෙන් අවධානය යොමුකර ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ 20 වන වගන්තිය හා 2011 පෙබරවාරි 24 දිනැති අංක 02/2011 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 4:3 ඡේදය | පළාත් පාලන ආයතන විසින් අරමුදලට ලැබිය යුතු රු. 1,385,579,004 ක හිඟ දායක මුදල පළාත් පාලන ආයතනවලට ගෙවීමට ඇති යම් මුදලකින් අඩුකර ගැනීමට හෝ අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. |
| (ආ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඒෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 (අ) ඡේදය | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර ඒ සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ඇ) | 2011 දෙසැම්බර් 15 දිනැති අංක 4/2011 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | විශ්‍රාම වැටුප් වර්ගීකරණයට අනුව අරමුදලේ වියදම පරිගණක පද්ධතිය මඟින් ලබාගැනීමට උපදෙස් දී තිබුණ ද ඒ අනුව වියදම ලබාගෙන ගිණුමේ දැක්වීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | 2012 පෙබරවාරි 08 දිනැති අංක 01/2012 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | ඒ ඒ මාසයේ අරමුදලට අදාල සාමාජිකයන්ගේ මියයෑම් පිළිබඳ වාර්තා ඊළඟ මාසයේ 25 වන දිනට පෙර දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් ගෙන්වාගෙන එම වාර්තා අනුව කාලීනව මියයෑම් ගැලපීමට පියවර ගෙන නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 36,428,661 ක ඌණතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 5,721,764 ක් වුයෙන්, ඉකුත් වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 42,150,425 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. කෙසේ වුවද 2.2.2 ඡේදයේ දක්වා ඇති ගිණුම්කරණ අඩුපාඩු මත මෙම මූල්‍ය ප්‍රතිඵලය තවදුරටත් වෙනස් නොවනු ඇතැයි බැහැර කළ නොහැකි විණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1. කාර්යසාධනය

1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ 15 වගන්තිය ප්‍රකාරව, පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත සාමාජිකයන්ට විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂිත දීමනා ගෙවීමේ අරමුණින් මෙම අරමුදල පිහිටුවා තිබුණද වැය ශීර්ෂය 253 යටතේ වාර්ෂික අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන මඟින් අරමුදලේ වියදම් දැරීම හේතුවෙන් මෙම අරමුදල පිහිටුවීමේ මූලික අරමුණ ඉටු වී නොතිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

අරමුදල් ගිණුමට එකතුවන දායක මුදල් සෑම මාසයකම අවසානයේ දී පමණක් දෙපාර්තමේන්තුවේ පොදු ගිණුමට මාරු කිරීම නිසා එම සෑම මාසයකම පළමු සති දෙක තුළදී එකතු වූ රු.1,506,900ක සිට රු. 11,821,245 ක් දක්වා වූ පරාසයක මුදල් ශේෂයක් නිෂ්කාර්යව රඳවාගෙන තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

2016 ජනවාරි 28 දිනැති අංක සීඑම්ඒ/**2009/(I)(II)** දරන කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතු වූවත් අරමුදලේ අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුවත් කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | අරමුදලේ ක්‍රියාකාරීත්වය පිළිබිඹු වන පරිදි නිවැරදිව ආදායම් හා වියදම් ගිණුම්ගත කර නොතිබීම. |
| (ආ) | දායක මුදල් අයකිරීම | හිඟ දායක මුදල් හා සමාලෝචිත වර්ෂයේ දායක මුදල් නිසි පරිදි අයකර ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඇ) | සාමාජික ලේඛනය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් තොරතුරු කැඳවා සාමාජික දත්ත යාවත්කාලීන නොකිරීම හා ඒ අනුව විශ්‍රාම වැටුප් වියදම තහවුරු කර නොතිබීම. |